**ශීර්ෂය 297- සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

-----------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

--------------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ඔක්තෝබර් 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 නොවැම්බර් 03 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම**,** විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුල බදු නොවන ආදායම් හා වෙනත් ආදායම් ලැබීම් වශයෙන්, ආදායම් ශීර්ෂ තුනක ආදායම රු.488,583,085 ක් දැක්විය යුතුවිය. එසේ වුවද එම ආදායම තුළ වූ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ගාස්තු ආදායමින් 1/3 ක කොටස වූ රු. 196,084,748 කින්, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත ලබා දුන් අත්තිකාරම් මුදලකට අදාළව හිලව් කරනු ලැබූ රු.96,795,880 ක් ආදායමෙන් ආපසු ගෙවීමක් ලෙස සටහන් කිරීම නිසා ආදායම එම ප්‍රමාණයෙන් අඩුවී රු.391,787,205 ක් ලෙස සටහන් කර තිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10.1 ඡේදය යටතේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරිමට අදාල මාර්ගොපදේශයේ 3.6 හි සඳහන් ආකාරයට ඒසිඒ-1 හි ආදායම ලෙස සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ගාස්තු ආදායමින් 1/3 ක කොටසින් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත ලබාදුන් මුදලට අදාලව හිලව් කළ යුතු ආදායම් ගලපා ශුද්ධ ආදායම් දක්වා ඇත. දෙපාර්තමේන්තු මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ආදායම් ලැබිම් ලෙස දක්වා ඇත්තේ ඒසිඒ-1හි දක්වා ඇති ආදායම බවය. | භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත ලබා දුන් අත්තිකාරම් මුදලකට අදාළව හිලව් කරනු ලබන මුදල ආදායමෙන් ආපසු ගෙවීමක් ලෙස සටහන් කිරීම නොකළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුලදී ගොනු කරන ලද සමාගම් සංඛ්‍යාව ආදායම් වර්ගීකරණ වාර්තාව අනුව 36,196 ක් වුවද, හිඟ ආදායම් ගණනය කිරීම්වලදී එය 20,973 ක් ලෙස සලකා තිබීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට ගණනය කරන ආදායම රු.91,338,000 ක් වී තිබුණි. ඉන් 1/3 ක් ඒකාබද්ධ අරමුදලට හිමි බැවින් සමාගම් | 2020.12.31 දිනට හිඟ ආදායම් වාර්තාව සකස් කිරිමේදි අතපසුවීමකින් ලේඛනගත ක්‍රමය මඟින් වාර්ෂික වාර්තා ගොනු කරන ලද සමාගම් සංඛ්‍යාව පමණක් ඇතුළත් කර ඇත. මාර්ගගත ක්‍රමය මඟින් වාර්ෂික වාර්තා ගොනු කරන ලද සමාගම් | හිඟ ආදායම් ගණනය කිරීම් නිවැරදිව කළ යුතුය. |

| | |
|---|---|
| රෙජිස්ට්‍රාර්වරයාගේ ගාස්තු යටතේ වන හිඟ හිටි ආදායම රු.30,446,000 කින් අධි ගණනය වී තිබුණි. | සංඛ්‍යාව 2020.12.31 දිනට සකස් කරන ලද හිඟ ආදායම් වාර්තාවට ඇතුළත් නොකළ හෙයින් හිඟ ආදායම අධිගණනය විමක් සිදු වි ඇත. එය නිවැරදි කිරිමට කටයුතු කරන බව. |

## 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

--------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතුකරන ලද ආදායම රු.4,330,335 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම වටිනාකම රු.60,814 ක් ලෙස දක්වා තිබුණි. | මුදලින් පමණක් සිදුවූ ගනුදෙනු මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් කර ගිණුම් පිළියෙල කරන ලදි. | ඒකාබද්ධ ශේෂ පිරික්ෂුමේ දළ අගයන් පදනම් කර ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය |
| (ආ) | දෙපාර්තමේන්තු ගිණුම් අනුව අත්තිකාරම් අයකර ගැනීම් හා ගෙවීම් පිළිවෙලින් රු.8,913,333 ක් හා රු.10,697,831 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.408,416 ක් හා රු. 6,515,590 ක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | පුද්ගල පඩිනඩි රු. 71,096,190 ක් වුවද එය රු. 63,579,376 ක් ලෙස ගලපා තිබූ අතර සහනාධාර හා මාරුකිරීම් රු.1,058,399 ක් ගලපා නොතිබුණි . | -එම- | -එම- |
| (ඈ) | තැන්පතු ලැබීම් රු.88,579 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා නොතිබුණු අතර තැන්පතු ගෙවීම් රු.88,579 ක් රු.83,429 ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් රු.1,049,565 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.949,152 ක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |

**2.** **මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1** **ආදායම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම් පනතේ 170 වගන්තිය ප්‍රකාරව පෞද්ගලික සමාගමක් නොවන සෑම සමාගමක්ම තම මූල්‍ය ප්‍රකාශ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කල යුතුය. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාළ සමාගම් සංඛ්‍යාව 7,175 ක් වුවද එයින් සමාගම් 1,001 ක් පමණක් පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කර තිබුණද සමාගම් 6,174 ක් හෙවත් සියයට 86 ක් එකී නියමයන් පැහැර හරිමින් කටයුතු කර තිබීම නිසා මූල්‍ය ප්‍රකාශ ලියාපදිංචි කිරීමේ ගාස්තුව ලැබී නොතිබුණි. | වර්තමානය වන විට පරිගණක ගත කිරීමේ ව්‍යාපෘතිය අවසන් අදියරේ පවතින බැවින් සියලුම ක්‍රියාකාරි පොදු සාමාගම් මාර්ගගත ක්‍රමය ඔස්සේ මූල්‍ය වාර්තා ගොනු කිරීම ආරම්භ කර ඇත. එමෙන්ම මාර්ගගත ක්‍රමය ඔස්සේම සිහිකැඳවීම් සිදු කරනු ලබන බැවින් ඉදිරියේදී ක්‍රියාකාරි පොදු සමාගම් මූල්‍ය වාර්තා නියමිත පරිදි ගොනු කරන බව. | සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත මූල්‍ය ප්‍රකාශ ලියාපදිංචි කල යුතු ක්‍රියාකාරී සමාගම් හඳුනාගැනීම හා ඒ අනුව එම ලියාපදිංචි කිරීමේ ගාස්තුව අයකර ගැනීමට කටයුතු කිරීම කළ යුතුය. |
| (ආ) | 1891 අංක 16 දරන සමිති ආඥා පනතේ (123 වෙනි අධිකාරිය) 8 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව සියළුම ලියාපදිංචි සමිති විසින් රු 1,000 ක් බැගින් ගාස්තු ගෙවා වාර්ෂික වාර්තා ගොනු කළ යුතුය. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වූ ලියාපදිංචි සමිති 15,851 කින් ක්‍රියාකාරි සමිති හඳුනාගෙන ඒකාබද්ධ අරමුදලට අයවිය යුතු ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර සමිති 16 කින් පමණක් රු.16,000 ක ආදායමක් ලැබී තිබුණි. | වාර්ෂික වාර්තා ගොනු කිරීම සිදුකරනුයේ ක්‍රියාකාරිව පවතින වාර්ෂික මහා සභා රැස්වීම් පවත්වා ඇති සමිති පමණක් වන අතර දැනට ලියාපදිංචි වී ඇති සමිති අතුරින් බොහෝමයක් සමිති ක්‍රියාත්මකව පවතින සමිති නොවේ. ක්‍රියාකාරි සමිති හඳුනාගැනිමට වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක බැවින් ඉන් පසු එම සමිති වල වාර්ෂික වාර්තා ගොනු කිරිමට අවශ්‍ය බව. | ලියාපදිංචි සමිතිවලින් වාර්ෂික වාර්තා ගොනු කළ යුතු සමිති සංඛ්‍යාව හඳුනාගැනීම හා ඒ අනුව වාර්ෂික වාර්තා ගොනුකිරීමේ ආදායම එකතුකර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ඇ) | 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත සෑම සමාගමකින්ම (අක්වෙරළ හා ඇපයෙන් සීමිත සමාගම් හැර) 2016 වර්ෂය සඳහා පමණක් අයකළ වාර්ෂික සමාගම් ලියාපදිංචි කිරීමේ බදු, ලැයිස්තුගත පොදු සමාගම් 54 කින් රු.54,000,000 ක් හා වෙනත් සමාගම් 423 කින් රු.63,450,000 ක් | සංශෝධනය කරන ලද වාර්ෂික සමාගම් ලියාපදිංචි කිරීමේ අයබද්ද ගෙවන ලෙස දන්වා 2019.01.11, 2020.01.27 හා 2020.07.15 යන දිනයන්හිදි භාෂාත්‍රයෙන් ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් මඟින් හා දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ | 2016 වර්ෂය සඳහා අයකරන වාර්ෂික සමාගම් ලියාපදිංචි කිරීමේ බදු නොගෙවූ සමාගම්වලින් එම මුදල් අයකරගැනීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වශයෙන් හිඟ කොටස් අයවිය යුතු වුවද එම ආදායම් අයකරගෙන නොතිබුණි. | දැන්වීම මඟින් මෙන්ම සීමාසහිත ලැයිස්තුගත පොදු සමාගම්(PQ) හා පොදු සමාගම්(PB) වෙත ලිපි මඟින් මෙම අයබද්ද ගෙවන ලෙස දන්වා බදු අයකරගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | |
| (ඇ) | දෙපාර්තමේන්තු තොරතුරු අනුව 2016 වර්ෂයට පෙර ලියාපදිංචි කරන ලද සමාගම් 71,802 කින් මෙම වාර්ෂික සමාගම් ලියාපදිංචි කිරීමේ බදු මුදල අයවිය යුතු වුවත්, ඉන් සමාගම් 18,631 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානයට අදාළ මුදල සම්පූර්ණයෙන් හෝ කොටසක් පමණක් හෝ ගෙවීම් කර තිබුණි. ඒ අනුව සමාගම් 53,171 කින් සම්පූර්ණ බදු මුදලම අය විය යුතුව ඇතත් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2016 වර්ෂයට පෙර ලියාපදිංචි කරන ලද ක්‍රියාකාරි සමාගම් බොහෝමයක් මෙම අයබද්ද ගෙවා ඇති අතර 2020 වර්ෂයේ කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් රටේ පැවති අයහපත් වතාවරණය හේතුවෙන් බොහෝ සමාගම් වලට මෙම අයබද්ද ගෙවීම අපහසු වි ඇති බව. | හිඟබදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. යහපාලනය**
---------------

**3.1 අභ්‍යන්තර විගණනය**
---------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම තුළ විගණනයට ලක් කළ යුතු විගණන ක්‍රියාකාරකම් 18 ක් හඳුනාගෙන තිබුණද ඉන් ක්‍රියාකාරකම් 17 ක් ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | 2021.05.10 දින සිට ස්ථිරව ගණකාධිකාරි 1 ශ්‍රේණියේ නිලධාරිනියක් ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරට පත් කර ඇති අතර ඒ අනුව අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර ඇති බව. | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට වග බලා ගත යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 04 කට අධික කාලයක සිට නීති නිලධාරී , සහකාර අධ්‍යක්ෂ (පරිපාලන), පුස්තකාලයාධිපති, ගොඩනැගිලි ඕවර්සියර් යන තනතුරු පුරප්පාඩුව පැවතුණ අතර, වසර 04 කට අධික කාලයක සිට සමාගම් රෙජිස්ට්‍රාර් I ශ්‍රේණියේ තනතුරු දෙක සඳහා රාජකාරී ඉටු කිරීමේ පදනමින් පත් කිරීම් කර තිබුණි. | සමාගම් රෙජිස්ට්‍රාර් I ශ්‍රේණියේ අනුමත තනතුරු සඳහා රාජකාරී ඉටුකිරීමේ පදනමින් පත් කළ නිලධාරිනියන් දෙදෙනා පළමු ශ්‍රේණියට උසස් කර ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමග ලිපි හුවමාරු වෙමින් පවතී.<br><br>නීති නිලධාරී - සම්මුඛ පරීක්ෂණ පවත්වා රාජ්‍ය සේවා කොමිෂන් සභවේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටි. සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) -වැඩ බැලීමේ පදනම මත 2021.10.04 දින සිට නිලධාරිනියක් පත් කර ඇත. පුස්තකාලයාධිපති/ ගොඩනැගිලි ඕවර්සියර්- ප්‍රායෝගිකව ඉල්ලුම්කරුවන් සොයා ගත නොහැකි නිසා වැඩිදුර කටයුතු සිදු නොවු බව. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩුව පවතින තනතුරු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අමප/18/0699/723/016 හා 2018 ජුනි 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාර 2018 වර්ෂයේ සිට වසරක කාලයකට වැඩ බැලීමේ පදනම මත නිලහාර ගැනුම්කරු හා තවත් නිලධාරීන් 04 දෙනෙකුව පත්කර තිබුණි. එම තනතුරු ඇතිකර වසර 2½ කට ආසන්න කාලයක් ගත වුවද, දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කරගැනීමට කටයුතු කර නොතිබුණි. | නිලහාර ගැණුම්කරු තනතුර අනුමත කර ගැනිම සඳහා 2021 වර්ෂයේදි මුදල් අමාත්‍යාංශ ලේකම් මහින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපි යවා ඇත. එම ඒකකය සඳහා කාර්ය මණ්ඩලයේ 4 දෙනෙකු වැඩ බැලීමේ පදනම මත 2021 ඔක්තෝම්බර් දක්වා සේවය කරන අතර ස්ථිරව නිලධාරින් බඳවා ගැනිමට ලිඛිතව කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා ඇත. | කාර්ය මණ්ඩල සාමාජිකයන් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීම කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දෙපාර්තමේන්තුවේ කටයුතු ඩිජිටල්කරණය කිරීමක් ලෙස 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක ROC ව්‍යාපෘතිය වෙනුවෙන් අවශ්‍ය තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලය පුළුල් කර ගැනීම සඳහා කළමනාකරණයේ අවධානය 2020 වර්ෂයේ යොමු වී තිබුණි. ඒ හේතුවෙන් දෝෂ සහිත තත්වයන්ද සමගින් ක්‍රියාත්මක ROC ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යවශ්‍ය තනතුරු වන අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) තනතුරු 01 ක්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුරු 02 ක් හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරු 03 ක් ඇතුළුව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ තනතුරු 06 ක් විගණන දිනය දක්වා පුරප්පාඩු වී පැවතුණි. | තොරතුරු තාක්ෂණ සේවයේ තනතුරු 06 පිරවීම සඳහා සුදුසු නිලධාරීන් මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර දෙන ලෙස ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීමක් කර ඇත. | පුරප්පාඩුව පවතින අත්‍යවශ්‍ය තනතුරු සම්පූර්ණ කර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |